## අංග රචනය

අංග රචනය විග්‍රහ කිරීමේ දී අංග යනුවෙන් අදහස් කරන්නේ මුහුණ ප්‍රධාන කොටගෙන ඇති ශරීරයේ අඟපසඟ වේ. අඟපසඟ චරිතයෙහි ස්වභාවයට අනුව සවිස්තරාත්මක ඉදිරිපත් කිරීම රචනය වේ. වර්ණ හා හැඩතල උපයෝගී කර ගනිමින් කෙනකුගේ බාහිර පෙනුම චරිතයට උචිත පරිදි හැඩ ගැන්වීම අංගරචනය වේ.

ප්‍රාසාංගික නර්තනයක් ඉදිරිපත් කිරීමේදී ශිල්පියාගේ බාහිර ස්වරූපය  වෙනස් නො වන පරිදි ස්වභාවික පිහිටීම මනා ලෙස ඉදිරිපත් කිරීම ස්වභාවික අංගරචනය වේ. අංග රචනයේ දී සිදු වන්නේ වර්ණ භාවිතයෙන් රේඛා හෝ වර්ණ ගැන්වීම මගින් මුහුණේ හැඩතල උද්දීපනය කිරීමකි.

**නර්තනාංගයක් සඳහා අංග රචනයේ දී සැලකිලිමත් විය යුතු කරුණු -**

- මුහුණේ පිහිටීම හා ස්වභාවය අධ්‍යයනය කිරීම
- මුහුණේ ප්‍රධාන කොටස් අවබෝධ කර ගැනීම
- මුහුණට සාපේක්ෂව බෙල්ලේ සහ අත් වල මූලික ආලේපනය යෙදීම
- ශිල්පියාගේ සමයේ වර්ණය ගැන සැලකිලිමත් වීම

මෙම ක්‍රියාවලියේ දී භාවිතා කරන ශිල්ප ක්‍රමය නම් වර්ණ භාවිත කරමින්  ත්‍රිමාණ බව මතු කිරීමට අනුගමනය කරන අඳුර හා එළිය නම් ශිල්ප ක්‍රමයයි. එනම් මෙහිදී නර්තනයක් ඉදිරිපත් කිරීමේ දී වේදිකාව ආලෝකමත් වීම තුළ ශිල්පියාගේ මුහුණ නියමාකාරයෙන් ප්‍රේක්ෂකයාට නොපෙනේ. එහි දී ත්‍රිමාන බව මතුකර ගත යුතුය. නළල නාසය නිකට ආලෝකයේ දී ඉදිරියට මතු කළ හැක. පැතලි ස්වභාවයක් ඇති මුහුණත් එම අංග ආලෝකය හමුවේ ඉස්මතු කිරීම තුළින් ත්‍රිමාණ බව පෙනෙයි. නාසය දෙපස අඳුරු පැහැය කර නාසය මුදුන එළිය කරනු ලබයි .එසේම කම්මුල් රෝස පැහැය කිරීම හා ඇස් තියුණුව ඇඳීම අයි

ෂැඩෝ භාවිතය.එමගින් අඳුරු කිරීම හා ආලෝකයට විවෘතකිරීම  මගින් ත්‍රිමාණ බව පෙන්වයි.

සාම්ප්‍රදායික නර්තනාංග හා  නව නිර්මාණ නර්තන අංග සඳහා ද මේ ආකාරයට අංග රචනය කළ යුතුය. සාම්ප්‍රදායික නර්තන සඳහා වූ අංග රචනය කිරීමේදීද වස්ත්‍රාභරණ සඳහා ගැළපෙන ලෙස කිසියම් ශෛලියකට අනුව අංග රචනාව සිදුකරයි.

නව නර්තන යේදී නිදහස් අංග රචනයක් භාවිතා වෙයි.චරිතයට උචිත ලෙස මෙහිදි ඇඳුම් පැළඳුම් භාවිතා කරයි. උදාහරණයක් ලෙස මොනර නැටුමේදී වස්ත්‍රාභරණ කට්ටලය මොනරාගේ  පාටින් සකස් කරයි. එහිදී මුහුණ ද එම වර්ණ වලින් eyeshadow කිරීම, එසේම ඇස් කෙළවල මොණර පිහාටු ඇඳීම . ආදී වූ ක්‍රම නිර්මාණ ශිල්පියා භාවිත කරයි.නව නර්තනයේදී නර්තනයට උචිත ලෙස ඉතාමත් අලංකාරව අංග රචනය යොදා  ගත හැක .

**ඇගයීම**

1. අංග රචනය කිරීමෙන් නළුවාට ඇති ප්‍රයෝජන දෙකක් ලියන්න
2. අංගරචනා විධික්‍රම විස්තර කරන්න
3. නව නර්තනයක් සඳහා අංග රචනය සිදු විය යුතු අයුරු විස්තර කරන්න